රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව.
சுதந்திர சதுக்கம், கொழும்பு 07, இலங்கை.
Independence Square, Colombo 07, Sri Lanka.

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: GS/SLAS/සංචිතයට අනුයුක්ත කිරීම | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2022.10. 27 |

අමාත්‍යාංශ ලේකම්වරුන්

පළාත් ප්‍රධාන ලේකම්වරුන්

කොමිෂන් සභා ලේකම්වරුන්

දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය යටතේ පවත්වාගෙන යන නිලධාරී සංචිතය අවසන් කිරීම

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සංචිතය වෙත විවිධ හේතුන් මත අනුයුක්ත කරනු ලබන ඇතැම් නිලධාරීන් නොයෙක් හේතුන් මත දිගු කාලයක් එම සංචිතයේ කිසිදු රාජකාරියක් ඉටු නොකරමින් රැඳී සිටින බවට නිරීක්ෂණය වී ඇත. අදාළ නිලධාරීන් මේ ආකාරයෙන් නිශ්චිත කාර්යභාරයක් ඉටු නොකර සිටීම මත එම නිලධාරීන් පෞද්ගලිකව දැඩි අපහසුතාවයකට පත්වන බැවිනුත්, ඵලදායී සේවාවක් ලබා නොගෙන වැටුප් ගෙවීම නිසා මූල්‍යමය පාඩුවක් සිදුවන බැවිනුත්, රට තුළ පවතින වත්මන් තත්ත්වය අනුව සියලු නිලධාරීන්ගෙන් උපරිම සේවාවක් ලබා ගැනීම අවශ්‍ය වන බැවිනුත්, මෙම තත්ත්වය කඩිනමින් වෙනස් කළ යුතු බවට යෝජනා වී ඇත. ඒ අනුව, දැනට මෙම අමාත්‍යාංශය යටතේ පවතින නිලධාරී සංචිතය පවත්වාගෙන යාමේ ක්‍රමවේදය අවසන් කිරීමට තීරණය කර ඇත.

02. මේ නිසා මින් ඉදිරියේදී රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ සංචිතය වෙත නිලධාරීන් අනුයුක්ත කිරීම සිදු නොකරන ලෙසට කාරුණිකව දන්වන අතර, ඉතාමත් අත්‍යාවශ්‍ය කරුණකදී යම් නිලධාරියෙකු මෙම අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලන අංශය වෙතට අනුයුක්ත කිරීම සිදු කළ යුතු නම්, එය මෙම අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය මත පමණක් සිදු කළ යුතු වේ.

03. තවද දිගු කාලීන විදේශ ශිෂ්‍යත්ව/පුහුණුවීම් සඳහා සහභාගී වන නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම මෙම අමාත්‍යාංශයේ පවතින අදාළ සේවාවන්ගේ කටයුතු කරනු ලබන අංශ වෙත පැවරීමට තීරණය කර ඇති අතර, ඒ අනුව උක්ත නිලධාරීන්ගේ ලිපිගොනු ඒ ඒ සේවා අංශ වෙත යොමු කිරීමට කටයුතු කළ යුතු ය. (රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 හි විධිවිධාන යටතේ වැටුප් රහිත විදේශ නිවාඩු ලබා දෙන ලද නිලධාරීන් සඳහා අනුප්‍රාප්තික නිලධාරීන් ලබා දීමක් සිදු නොවන බැවින්, එම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීම සිදු නොකළ යුතු ය.)

දුරකතන / தொலைபேசி / Telephone: 011-2696211-13, 011-2166000 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2695279 | ඊ-මේල් / மின்னஞ்சல் / E-mail: information@pubad.gov.lk | වෙබ් අඩවිය / வெப்தளம் / Website: www.pubad.gov.lk

04. එමෙන්ම විනය කරුණක්/විමර්ශන වාර්තාවක් මත නිලධාරියෙකු වත්මන් සේවා ස්ථානයෙන් පිටතට ස්ථාන මාරු කිරීමට නිර්දේශ කර ඇති අවස්ථාවකදී, සුදුසු සේවා ස්ථානයකට ස්ථාන මාරු කිරීමට හැකිවන පරිදි නිර්දේශ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු අතර, ප්‍රායෝගික කරුණු මත කඩිනමින් ස්ථාන මාරු කළ යුතු වේ නම්, සුදුසු සේවා ස්ථානයක් ලබා දෙන තෙක් තම අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව වෙත තාවකාලිකව ස්ථානගත කර ස්ථාන මාරුවීමට අදාළ ඉල්ලීම් මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීම සුදුසු වේ.

05. තවද පළාත් සභා සේවයෙන් නිලධාරීන් මුදා හරින්නේ නම්, වෙනත් සුදුසු සේවා ස්ථානයක් වෙත ස්ථාන මාරු කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් ලැබෙන පරිදි එම ඉල්ලීම මෙම අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කරන මෙන් කාරුණිකව දන්වන අතර, ඒ අනුව, එම නිලධාරීන් කඩිනමින් සුදුසු සේවා ස්ථාන වෙත ස්ථාන මාරු කිරීමට කටයුතු සිදු කරනු ඇත.

06. මේ සම්බන්ධයෙන් ඔබ දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

එම්.එම්.පී.කේ. මායාදුන්නෙ
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
දුරකථන : 0112-695738
ෆැක්ස් : 0112-695279
විද්‍යුත් ලිපිනය : pubad.secretary@sltnet.lk